ආසියා – පැසිපික් වෙළඳ ලුහුඬු සටහනඃ

ශ්‍රී ලංකාව.

- 2009 ගෝලීය ආර්ථික අර්බුදයෙන් පසුව 2010 හා 2011 වසර වල වාර්ෂිකව සියයට 20 වේගයකින් වෙළඳ භාණ්ඩ අපනයනය ඉහළ ගියේය. කෙසේ වෙතත් මෙම කාලසීමාවේ දී ආනයන දෙගුණයකින් ඉහළ යෑම නිසා වෙළඳ ශේෂය පහත වැටිණ. 2012 වසරේ දී අපනයන සියයට 7 කින් පහත වැටුණ අතර ආසියා – පැසිපික් කලාපයේ අපනයන සියයට 2 ක සාමාන්‍යයකින් වර්ධනය විය. ( රූප සටහන් 1 සහ 2)
- මුළු වෙළඳ භාණ්ඩ අපනයනයෙන් සියයට 60 කට වැඩි ප්‍රමාණයක් වූ නිෂ්පාදිත භාණ්ඩ අපනයනයේ ප්‍රමුඛ විය. ඊළඟට වැදගත් වන්නේ සියයට 26 ක් වන ආහාර සම්බන්ධ නිෂ්පාදිතයන්ය. ( රූප සටහන 6)
- රට තුළට ගලා ආ විදේශීය ඍජු ආයෝජන ප්‍රමාණය 2009 දීඩොලර් දශ ලක්ෂ 400 සිට 2012 දී ඩොලර් දශ ලක්ෂ 800 දක්වා වැඩි විය. කෙසේ වෙතත් රටට තුළට ගලා ආ විදේශීය ඍජු ආයෝජන කොටස් ප්‍රමාණය කලාපයේ සාමාන්‍යය හා සසඳන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් අඩක් වන නිසා රටට ඊට වඩා වැඩි ප්‍රමාණයක් දරා ගැනීමේ හැකියාවක් පවතී. ( රූප සටහන 1සහ 3)
- ආසියා – පැසිපික් උප කලාපීය රටවල් බොහොමයක වෙළඳාමේ දී වෙළඳ පිරිවැය සාමාන්‍යයට වඩා අඩුය. පිරිවැය දකුණ හා නිරිත දිග ආසියානු රටවල් සමග මෙන්ම නැගෙනහිර සහ ඊසාන දිග රටවල් සමග වෙළඳාමේ දී විශේෂයෙන්ම අඩුය. උතුරු සහ මධ්‍යම ආසියානු රටවල් සමග වෙළඳාමේ දී පිරිවැය ඉහළ යන්නේ භූගෝලීය බාධක නිසාය. ( රූප සටහන 5)
- ශ්‍රී ලංකාව වරණාත්මක වෙළඳ ගිවිසුම් ( PTA ) 6 ක් අත්සන් කළද එම හවුල්කරුවන්ට යොමු වන්නේ මුළු අපනයනයෙන් සියයට 10 ක් පමණි. එහෙත් කලාපයේ සාමාන්‍යය සියයට 36 කි. ( රූප සටහන 1)

රූප සටහන 1 වෙළඳ සහ ආයෝජන කාර්ය දර්ශක (2012)




විදේශ ඍජු ආයෝජන කොටස්/ ද.දේ.නි.

වරණාත්මක වෙළඳ ගිවිසුම් රටවලට අපනයන සාමාන්‍යය 2009- 2011

අපනයන වර්ධනය

ආනයන කා වැදීම්.

වෙළඳ ක්‍රියාපටිපාටි සම්පූර්ණ කර ගැනීමට ගතවන දින

ශ්‍රී ලංකාව ආසියා- පැසිපික් සාමාන්‍යය

රූප සටහන 2. භාණ්ඩ වෙළඳාම




රූප සටහන 3 විදේශීය සෘජු ආයෝජන ගැලීම




විදේශීය සෘජු ආයෝජන ගලා ඒම්

රූප සටහන 4 වෙළඳ බාධක



රූප සටහන 5. ආසියා – පැසිපික් උප කලාප සමග වෙළඳ පිරිවැය ( තීරු බදු හැර)




රූප සටහන 6 කාණ්ඩ අනුව අපනයන සංයුතිය ( 2010 – 2012 )




සටහන්:

FDI විදේශ සෘජු ආයෝජන

PTA වරණාත්මක වෙළඳ ගිවිසුම

MFN වඩාත් අනුග්‍රහ ලත් රාජ්‍යය

STRI සේවා වෙළඳාමේ සීමා පැනවීමේ දර්ශකය
http//iresearch.worldbamk.org/servicetrade/

නිර්වචනය කිරීම්:

ආනයන කා වැදීම්: දේශීය ඉල්ලුමේ ආනයන අනුපාතය

PTA ආවරණය: 2009 – 11 කාල සීමාවේ සමස්ත අපනයන සාමාන්‍යයේ PTA හවුල් කරුවන්ට කරන ලද අපනයන සාමාන්‍යය

වෙළඳ පිරිවැයඃ දේශීය වෙළඳ භාණ්ඩ වෙළඳාමට අදාල පිරිවැය සමග අන්තර්ජාතික භාණ්ඩ වෙළඳාමේ සියලු පිරිවැය. 2006- 11 සාමාන්‍යය.

MFN පැනවීමඃ ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයන් අතර ආනයන සඳහා පැනවෙන තීරු බදු

MFN Bound ලෝක වෙළඳ සංවිධානයේ බැඳීම් ලෙස එකඟ වූ MFN තීරු බදු උපරිමය

මූලාශ්‍රයඃ වෙනත් ආකාරයට සඳහන් නොවන අවස්ථාවල ආසියා පැසිපික් වෙළඳ සහ ආයෝජන වාර්තාව ( APTIR )

වැඩි විස්තර සඳහා escap-tid.org